**වර්ෂ 2022 ක්වූ මැයි මස 19 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා**

**රැස්වීමේ වාර්තාව**

වේලාව - පෙරවරු 10.00

- පැමිණීම

| | |
|---|---|
| 01.D.Gගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීර්ති රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධර්මසිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05.S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06.G. ජයන්ත කීර්තිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. M.G.R.පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12.W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13.A.H.A.රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. H.G සුසිලාවති මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 22. W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 23. P.T.Gවයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |

24. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

25. R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26. H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27. N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

28. ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. K.D. පුෂ්පරාණි මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

.<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

30.පාලිත මහින්ද ජිනදාස මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

31.මොහොමඩ් මුරාඩ් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

32.දිසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34. G.A අරුණ ප්‍රසන්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

35.ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36.මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

39.සෙල්වරාජ් කාර්තිකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

40.K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41.කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**<u>1.පසුගිය මහසභාවේ සභා වාර්ථාව සභා සම්මත කිරිම</u>**

පසුගිය අප්‍රේල් මස 08 වන දින මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

පසුගිය අප්‍රේල් මස 08 වන දින මහ සභා වාර්ථාව සභා සම්මත කරන ලෙසට මම යෝජනා කරමි.

**ගරු කීර්ති රත්නායකමන්ත්‍රීතුමා**

පසුගිය මස මහ සභා වාර්ථාව සත්‍ය වාර්ථාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ජයන්ත කීර්තිසිංහ මන්ත්‍රීතුමා**

පසුගිය මස මහ සභා වාර්ථාව සත්‍ය වාර්ථාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය පල කරන ලදි.

ඒ අනුව සභා වාර්ථාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

2.1)1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් බැරකම් ප්‍රකාශ කිරිමේ පනතට අනුව පළාත් පාලන ආයතන සදහා තේරිපත්වූ මහජන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ එම අදාළ වර්ෂයේ ජූනි මස 30 වන දිනට පෙර භාරදිය යුතු අතර එම නිසා උඩපළාත ප්‍රාදේශීය සභාවේ සියළුම මහජන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ 2022 ජූනි මස 30 වන දිනට පෙර අනිවාර්යෙන් ලබාදීමට කටයුතු කරන ලෙස දන්වන නිවේදනය සභාගත කරන ලදි.

2.2) 2022/01/25 දින මහ සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එවා ඇති ලිපිය සම්බන්ධ නිවේදනය සභාගත කරන ලදි.

**3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම**

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**
සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි නොමැති බව සදහන් කරන ලදි.

**4.කල් දී ඇති ප්‍රශ්න -** නොමැති බව සදහන් කරන ලදි.

**5.කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

**තීරණ අංක 05.1 (1)**

5 (1.1)උඩපළාත ප්‍රාදේශීය සභා හිටපු ගරු සභාපති නිශ්ශංක හේරත් මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

උඩපළාත ප්‍රාදේශීය සභා හිටපු ගරු සභාපති නිශ්ශංක හේරත් මැතිතුමා උඩපළාත ප්‍රාදේශීය සභාවේ දෙවන සභාපතිවරයා වූ බවත් එතුමා සභාපතිවරයෙකු මෙන්ම පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස බල ප්‍රදේශයට

බොහෝම නිහතමානීව සේවය කල බවත් සදහන් කරමින් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කරමින් අදහස් දැක්වීමට අවස්ථාව සලසා දෙන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

හිටපු සභාපති ගරු නිශ්ශංක හේරත් මැතිතුමා මිය යන අවස්ථාව දක්වාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ගම්පොල ආසන සංවිධායකවරයා ලෙස කටයුතු කල බවත් එතුමා 1997 වර්ෂයේදි අප සමඟ ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වී විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන මන්ත්‍රීවරයා වී ඉන්පසු සභාපති තනතුරට පත්වූ බවත් ඉන්පසු තම නිළ කාල සීමාව අවසන් වීමට පෙර පළාත් සභාවට මන්ත්‍රීවරයෙකු ලෙස ඉදිරිපත් වූ ගමන්ම තේරි පත් නොවුනත් පෙර තේරී පත්වූ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුට තේරී පත්වීම නිසා ගරු නිශ්ශංක හේරත් මැතිතුමා ලැයිස්තුවෙන් පළාත් සභාවට තේරී පත්වූ බවත් එතුමා එතුමාගේ පාලන කාලය තුල උඩපළාත ප්‍රාදේශීය සභාවට සභාපතිවරයා ලෙස විශාල සේවයක් කල බවත් විශේෂයෙන් පුස්සැල්ලාව පුස්තකාල ගොඩනැගිල්ල,දොළුව පුස්තකාල ගොඩනැගිල්ල,දොළුව වෙළඳ සංකීර්ණය ආදි අනාගතයට ඵල ප්‍රයෝජන සහිත ව්‍යාපෘති එතුමාගේ පාලන කාලය තුල ඉටුකල බවත් එමෙන්ම ග්‍රාමීය මංමාවත් හා පොදු මහජන අවශ්‍යතා ඉටුකිරීම සදහා කල හැකි උපරීම සේවයක් කල බවත් එමෙන්ම දේශපාලනික ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වී හිටපු ගරු අග්‍රාමාත්‍ය දී.මු.ජයරත්න මැතිතුමා කෘෂිකර්ම අමාත්‍යවරයාව කටයුතු කල කාලයේ එතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස ගරු නිශ්ශංක මැතිතුමා සේවය කල බවත් එමෙන්ම එතුමා ජීවිතක්ෂයට පත්වන තෙක් ගරු රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරි ලෙස කටයුතු කල බවත් එවැනි තනතුරු ගණනාවක් හොබවමින් එතුමා පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙසද පළාත් සභාවෙන් ප්‍රතිපාදන ලබාදීමට උපරිම සහයෝගය ලබාදුන් බවත් එතුමාගේ අභාවයට සතියකට පමණ පෙරද පලාත් පාලන ආණ්ඩුකාරතුමාගේ සහ මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ එතුමාගේ යෝජනා මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බවත් එතුමාගේ අභාවය අපේ බල ප්‍රදේශයට විශාල පාඩුවක් බවත් සදහන් කරමින් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් උඩපළාත ප්‍රාදේශීය සභාවේ සංවේගය අද දින මෙලෙස ප්‍රකාශ කල බව දන්වා එතුමාගේ බිරිඳ ඇතුළු ඥාතීන් වෙත ලිපියක් යොමු කරන ලෙස ඉල්ලමින් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

හිටපු පළාත් සභා මන්ත්‍රී, ප්‍රාදේශීය සභා සභාපති ගරු නිශ්ශංක හේරත් මැතිතුමා තම ගම් ප්‍රදේශයේ බවත් තම බිරිඳගේ ඥාතියෙකු බවත් එතුමා විශාල සේවයක් කල නායකයෙකු බවත් තමා හා එතුමා අතර යම් යම් දේශපාලන මතගැටුම් තිබූ බවත් ඒ නමුත් අපි අතර තිබූ බැදීම නොනැසී පවතින බවත් එතුමා ගම්පොල ප්‍රදේශය වෙනුවෙන් හිටපු අගමැති ගරු දී.මු.ජයරත්න මැතිතුමා පසුපසින් සිටි දේශපාලඥයෙකු බවත් එතුමාගේ ආදාහන කටයුතු සිදුවූ ආකාරය පිළිබඳව තමා කණගාටු වන බවත් එය ආදාහන කමිටුවක් දමා ගෞරවාන්විතව කල යුතුව තිබූ බවත් එතුමාගේ දේහය විනාඩි දහයකට හෝ ගෞරව දැක්වීමට සභාවට ගෙන ඒමට තිබූ බවත් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් උඩපළාත ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලයේ මෙන්ම සමඟි ජන බලවේගයේ ශෝකය තමා ප්‍රකාශ කරන බවත් සදහන් කරමින් මෙම අවස්ථාව උදාකර දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් එතුමාට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

<u>ගරු ජයන්ත කීර්තිසිංහ මන්ත්‍රීතුමා</u>

පළාත් සභා ගරු මන්ත්‍රී නිශ්ශංක හේරත් මැතිතුමා මෙම ප්‍රදේශයේ සිටි ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු බවත් එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරිමට ඉඩ ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත් එතුමා දොළුව අඹගස්තැන්න ප්‍රදේශයෙන් ජන්මය ලබා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා පිරිවෙන්

ගුරුවරයෙකු ලෙස රාජ්‍ය සේවයට ආ බවත් 1991 වර්ෂයේ එතුමා පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය නොලැබුවත් 1997 වර්ෂයේ දී එවකට කෘෂිකර්ම වන සම්පත් හා ඉඩම් අමාත්‍යතුමාගේ මහජන සම්බන්ධීකරණ නිලධාරි ලෙස ඉමහත් සේවයක් කල බවත් තම ප්‍රදේශයේ විශාල ප්‍රමාණයකට රැකියා ලබාදීමට කටයුතු කල බවත් සංවර්ධන කටයුතු වලදීද ලොකු සේවයක් කල බවත් උඩපළාත ප්‍රාදේශීය සභාවේ දෙවන සභාපතිවරයා ලෙස විශාල මෙහෙවරක් කල බවත් මංමාවත් සංවර්ධනය කල බවත් විශේෂයෙන් ජනතාවට පානීය ජලය ලබාදීම වෙනුවෙන් විශාල කැපකිරීමක් කල බවත් උඩපළාත ප්‍රාදේශීය සභාවට පුස්සැල්ලාව පුස්තකාලය,දොළුව වෙළඳ සංකීර්ණය සහ පුස්තකාලය සකස් කර විශාල සේවයක් කල බවත් එවකට ගරු අගලවත්ත උප සභාපතිතුමා,ගරු ශාන්ත මන්ත්‍රීතුමා යන අය එතුමා සමඟ උරෙන් උර ගැටී සංවර්ධන කටයුතු කල බවත් එයට ගරු කීර්ති මන්ත්‍රීතුමා විපක්ෂයේ සිට සහයෝගය ලබාදුන් බවත් ගරු නිශ්ශංක හේරත් මැතිතුමා 1999 වර්ෂයේ පළාත් සභාවට තරඟ කර මනාප අඩු වුවත් පසුකාලීනව 2022 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දුන් බවත් ඉන්පසු පළාත් සභාවේ සිට ප්‍රාදේශීය සභාවට විශාල සේවයක් කල බවත් එසේම ගම්වල සියළුම අවමංගල අවස්ථා වලට එතුමා සහභාගී වු බවත් එමෙන්ම එතුමාගේ දේශපාලන ගමන පළාත් සභාවෙන් අවසන් වීම පිළිබඳව තමා කණගාටු වන බවත් එතුමා ඉදිරියට යා යුතු නායකයෙකු බවත් එතුමා රෝගාතුර වී හදිසි හෘදයාබාධයකින් ජීවිතක්ෂයට පත්වූ බවත් සඳහන් කරමින් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරන ලදි.

<u>ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා</u>

ග්‍රාමීය ජනතාවට ඉතා සමීපව එතුමා කටයුතු කල බවත් අපි පක්ෂ දෙකක සිටියත් එතුමා නියම මහජන නියෝජිතයකු ලෙස ක්‍රියාකල බවත් 1991 දේශපාලනයට අවතීර්ණ වු එතුමා එයින් ජයග්‍රහණය නොකලත් 1997 පළාත් පාලන මැතිවරණයේදි පොදුජන එක්සත් පෙරමුණෙන් ඉදිරිපත්ව වැඩිපුර මනාප ලබාගත් බවත් එම වකවානුව තුළ විපක්ෂයක් හා ආණ්ඩු පක්ෂයක් තිබු බවත් එම කාලයේ දැඩි ලෙස ආණ්ඩු පක්ෂය හා විපක්ෂය අතර ගැටුම් තිබු බවත් තමා එවකට විපක්ෂ නායක ලෙසත් එතුමා සභාපති ලෙසත් තම කාර්යභාරය අකුරට කල බවත් එවකට එතුමා ආණ්ඩු පක්ෂය ශක්තිමත් කල බවත් තමාගේ දැඩි ඉල්ලීම මත එතුමා විපක්ෂ නායක කාර්යාලයක් සභාවේ ආරම්භ කර දුන් බවත් ඒ සඳහා සම්පූර්ණ පහසුකම් ලබාදුන් බවත් එතුමා ගම් මට්ටමට ගොස් ග්‍රාමීය ජනතාවට සැබෑ මහජන නියෝජිතයෙකුගෙන් විය යුතු කාර්යභාරය කල බවත් සියලුම අවමංගල අවස්ථා නියෝජනය කල බවත් උපාධිධාරියකු ලෙසත් රංතැටිය පිරිවෙනේ ගුරුවරයකු ලෙසත් ජනතාව සමග යහපත් සම්බන්ධතාවක් තියාගත් බවත් මුලු බල ප්‍රදේශයටම විශාල සේවයක් කල බවත් එතුමාගේ අභාවය අප සියලු දෙනාටම සිදුවු අභාග්‍යසම්පන්න සිදුවීමක් බවත් එතුමාගේ අවමංගල අවස්ථාවට අපි සහභාගි වු බවත් උප සභාපතිතුමා ප්‍රකාශ කල ලෙස එම අවමංගල කටයුත්ත සිදු කල ආකාරය පිළිබඳව තමාද කණගාටු වන බවත් එහි අපේ පාර්ශවයෙන් අඩුපාඩු සිදුවු බවත් එතුමාගේ දේහය පැයකට හෝ සභාවට ගෙනවිත් අවසන් ගෞරවය දැක්වීමට තිබු බවත් දොළුව හාලියද්ද සුසානභූමියේ මිහිදන් කර ඇති එතුමාගේ දේහයට ගෞරවයක් ලෙස තැන්පත් කල ස්ථානයේ ස්මාරකයක් සාදා එම සොහොන් ගැබ නිසියාකාරව සකස් කල යුතු බව සඳහන් කරන බවත් ඉල්ලමින් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාට උතුම් අජරාමර නිවන් සැප ලැබේවා!යි ප්‍රාර්ථානා කරන ලදි.

<u>ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා</u>

ගරු නිශ්ශංක හේරත් මැතිතුමා 1988 /89 වසර වලදි රටේ පැවති ප්‍රචන්ඩත්වයෙන් භීතියට පත් කාල සමයේ ගුරු පියෙකු ලෙස උපකාර කල අයකු බවත් එතුමා කලුගමුව ,ගනේගොඩ ,ගල්ඔය, දොළුව,ගුරුකැලේ හා වාරියගල යන ප්‍රදේශ වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපනය ලබා දුන් බවත් එතුමාගේ උපකාර නොමැතිව අපට අධ්‍යාපනය කටයුතු එවකට කර ගැනිමට නොහැකි බවත් කලුගමුව,ගනේගොඩ,ගල්ඔය ප්‍රදේශ එතුමා

දේශපාලනය කිරිමට එන අවස්ථාවේ සංවර්ධනය වි නොතිබු බවත් නමුත් එතුමා දේශපාලනයට විත් උඩපළාතේ ප්‍රාදේශිය සභාවේ සභාපති ලෙස පත්වී එම ප්‍රදේශවල ගම් සහා පාරවල් ඇතුළු සියලුම යටිතල පහසුකම් සංවර්ධනය කල බවත් එතුමා සිදුකල සේවය පිළිබඳව අදටත් ජනතාව ප්‍රකාශ කරන බවත් කලුගමුව ,ගනේගොඩ ,ගල්ඔය ප්‍රදේශවල ජනතාවගේත් මගේ පවුලේ අයගේත් ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථානා කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

ගරු නිශ්ශංක හේරත් මැතිතුමා ගම්පොලට පමණක් නොව මහනුවර දිස්ත්‍රික්කයටම විශාල සේවාවක් කල බවත් අපි දිර්ඝ කාලයක් සමිපව ආශ්‍රය කල බවත් අපේ ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා එතුමාගේ සහයෝගය ලබා ගැනිමට අපට හැකි වු බවත් ගරු දි.මු.ජයරත්න මැතිතුමාගේ පිටුපස සෙවනැල්ලක් සේ හිද විශාල මෙහෙවරක් කල බවත් පළමු මැතිවරණයේදි වාර්තා ගත ලෙස ඡන්ද ලබා ගනිමින් ජයග්‍රහණය කල බවත් එතුමා සැම ගමකටම ගොස් සංවර්ධන කටයුතු කල බවත් ගම්වල සියළුම නිවාස වලට යාමට හැකි ලෙස පාරවල් සාදන ලද්දේ එතුමා බවත් එතුමාගේ ඡන්ද පදනම තිබුනේ ගම්පොල බවත් ගම්පොල ඡන්ද ගණන් කරන විට එතුමා ජයග්‍රහණය කර අවසන් බවත් එතුමා ගේ අභාවය ගම්පොල ජනතාවට දරාගත නොහැකි පාඩුවක් බවත් ජනතාවට ප්‍රශ්නයක් වු විට එතුමා අසලට ගිය බවත් එහිදි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළු දෙනාට උපකාර කල බවත් පළාත් සභාව විසුරුවා හැරිමෙන් පසු ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමාගේ සම්බන්ධිකරණ ලේකම් ලෙස මිය යන තෙක්ම සේවය කල බවත් එතුමාගේ අවසන් කටයුතු පිළිබඳව අද කතා කලත් එතුමා බොහෝම සරල මිනිසෙකු නිසා සරලව අවසන් කටයුතු කරන්නට ඇතැයි තමා සිතන බවත් සඳහන් කරමින් එතුමාගේ අභාවය සම්බන්ධව උඩපළාත ප්‍රාදේශිය සභාවේ මෙන්ම මාගේ පෞද්ගලික ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථානා කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු උදයකුමාර දිසානායක මන්ත්‍රීතුමා</u>

මා රැකියා කටයුතු සඳහා ගොස් සිටි නිසා එතුමාගේ අවමංගල අවස්තාවට තමාටද සහභාගි විමට නොහැකි වු බවත් එතුමා හොරකමට,දූෂණයට,වංචාවට සම්බන්ධ නොවු බවත් සැමදාම පුංචි මිනිසුන් සමග ගැලරියේ සිට දේශපාලනය කල බවත් ධනයට හෝ බලයට එතුමා නොනැමුණු බවත් සඳහන් කරමින් එතුමාගේ අභාවය සම්බන්ධව උඩපළාත ප්‍රාදේශිය සභාවේ මෙන්ම මාගේ පෞද්ගලික ශෝකය ප්‍රකාශ කරමින් ගරු නිශ්ශංක හේරත් මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථානා කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

හිටපු ගරු සභාපති නිශ්ශංක හේරත් මැතිතුමා වෙනුවෙන් ප්‍රථමයෙන් තමාගේ ශෝකය ප්‍රකාශ කරන බවත් එතුමා 1991 සිටම දේශපාලන ක්ෂේත්‍රයේ අපි හඳුනන දේශපාලනයේ නියලුනු පුද්ගලයකු බවත් එතුමා ගම්පොල ආසනය ජයග්‍රහණය සඳහා ගෙන යාමට කටයුතු කල පුද්ගලයකු බවත් අපේ ගරු මන්ත්‍රිවරුන් සඳහන් කල ආකාරයට ගම්වල සැම පුද්ගලයකු සමඟ ම හැමවිටම කටයුතු කල අයෙකු බවත් ජනතාවගේ සැම ප්‍රශ්නයක්ම ඔහු සමඟ කතා කල හැකි දේශපාලඥයෙකු බවත් එතුමා අපට තිබු ලොකුම ශක්තියක් බවත් ගරු නිශ්ශංක හේරත් මැතිතුමා ගම්පොලින් එහාට නොගිය බවත් ඒ නිසා ග්‍රාමිය ජනතාවට අද එතුමාගේ වියෝව,පාඩුව දැනෙන බවත් හිටපු පළාත් සභා මන්ත්‍රී ,හිටපු ප්‍රාදේශිය සභා සභාපති නිශ්ශංක හේරත් මැතිතුමා අද අප අතරින් වෙන්වු වුවත් එතුමා සමාජයට දැක්වු ආදරය සිදුකල මෙහෙවර මෙන්ම

පක්ෂයක් ලෙස ප්‍රමුඛස්ථානය ගෙන සිදුකල කටයුතු මතක් කරන බවත් එතුමා ප්‍රාදේශීය සභා සභාපති ලෙස සිටි අවධියේ බන්ධනාගාර ගතවූ බවත් විවිධ අසාධාරණකම් වලට ලක්වූ බවත් ඒ කෙසේ වුවත් දේශපාලනයෙන් එතුමා නොනැවතුනු බවත් ගරු දි.මු.ජයරත්න මැතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරි වශයෙන් 1994 සිට කටයුතු කල බවත් ඒ තුලින් එතුමාගේ දේශපාලන ගමන ශක්තිමත් වූ බවත් එමඟින් එතුමාට ප්‍රාදේශීය සභාවේ සභාපති විමට හැකිවූ බවත් එම කාලය තුළ තමා උප සභාපති ලෙස එතුමා සමඟ එක්ව අප බල ප්‍රදේශයේ විශාල සේවයක් කල බවත් ගරු දි.මු.ජයරත්න අගමැතිතුමාගේ අමාත්‍යාංශ වල තිබූ බැකෝ යන්ත්‍ර යොදාගෙන අප ප්‍රාදේශීය සභාවට අයත් පාරවල් සංවර්ධනය කල බවත් 1994 -2000 යන කාල සීමාවේ එතුමාගේ නායකත්වයෙන් විශාල වැඩ කොටසක් සිදු කල බවත් එතුමා නගර සංවර්ධනය සඳහා දොළුව ගොඩනැඟිලි මෙන්ම පුස්සැල්ලාව පුස්තකාල ආදිය ඉදි කර උඩපළාත ප්‍රාදේශීය සභාවට ප්‍රාග්ධන වත්කම් වැඩි කල සභාපතිවරයකු බවත් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තෙවතාවක් ගම්පොල ආසනයේ මෙන්ම මහනුවර දිස්ත්‍රික්කයටම දැවැන්ත සංවර්ධනයක් සිදුකල නායකයෙක් බවත් එතුමාගේ අවසන් කටයුතු සිදු කිරිමේදි විශාල උත්සව සංවිධානය කිරිමට එම පවුලේ අයගේ සුදානමක් නොතිබූ බවත් සරල ආකාරයෙන් අවසන් කටයුතු සිදුකල බවත් එසේම උඩපළාත ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සභාවෙන් කලයුතු උපකාර සියල්ල කල බවත් රට අස්ථාවර වීමත්,විශාල වියදමක් දැරිමට සිදුවිම ආදි හේතු නිසා එලෙස උත්සවයක් නොකල බවත් සඳහන් කරමින් අප අතරින් සමුගත් උඩපළාත ප්‍රාදේශීය සභාවේ හිටපු දෙවන සභාපති හිටපු පළාත් සභා මන්ත්‍රී නිශ්ශංක හේරත් මහතාට නිවන් සුව ප්‍රාර්ථනා කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා</u>

ගරු නිශ්ශංක හේරත් මැතිතුමාට දේශපාලනයේ ලොකුම අසාධාරණයක් සිදුවූ බවත් එතුමා වෙනුවෙන් බොහෝ අය පෙනි සිට නැති බවත් සඳහන් කරමින් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් තමාගේ ශෝකය සහ තම පක්ෂයේ ශෝකය ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු නිශ්ශංක හේරත් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක යෝජනාවක් ඉදිරිපත් කර සියළු දෙනා අදහස් දැක්වූ බවත් එසේම පවුලේ අයගෙන් හෝ මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලීමක් නැතිව දේහය සභාවට ගෙන එනවාද නැද්ද යන්න තමාට ප්‍රකාශ කල නොහැකි බවත් සභාව වෙනුවෙන් සභාපති ලෙස තමාට කල හැකි සියළුම කටයුතු ආදාහන උත්සවය අවසන් වන තුරු තමා කල බවත් ගරු කිර්ති මන්ත්‍රීතුමා හොඳ අදහසක් ඉදිරිපත් කල බවත් අපිට සභාවෙන් මුදල් වියදම් නොකර අපි සියළු දෙනා එකතු වී එතුමාගේ දේහය තැන්පත් කර ඇති ස්ථානයේ එතුමාට ගෞරව පිණිස ස්මාරකයක් ඉදිකරමු යැයිද එම අවමංගල අවස්ථාවේ අපෙන් යම් අඩුපාඩුවක් වුනානම් ඊට කණගාටුව ප්‍රකාශ කරන බවත් අපිට කල හැක්කේ එතුමාට පිං අනුමෝදන් කිරිම පමණක් බවත් සඳහන් කරමින් තමා සභාපති ලෙස උඩපළාත ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් හා උඩපළාත ප්‍රදේශයේ ජනතාව වෙනුවෙනුත් එතුමා පිළිබඳ ශෝකය එතුමාගේ පවුලේ අයට ප්‍රකාශ කරන අතර මෙම ශෝක යෝජනාව පවුලේ අයට යවන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (2)</u>**

5 (1.2)උඩපළාත ප්‍රාදේශීය සභා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගරු සී.බී.වේරපිටිය මන්ත්‍රීතුමාගේ හදිසි අභාවය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

අපේ සහෝදර ගරු වේරපිටිය මන්ත්‍රීතුමාගේ අභාවය කණගාටුදායක පුවතක් බවත් ඒ අවස්ථාවේදි සභාපති ලෙස තමාට කිරිමට ඇති කටයුතු තමා කල බවත් එවන් ජ්‍යෙෂ්ඨ යහපත් මන්ත්‍රීවරයකු නැතිවීම අපට විශාල පාඩුවක් බවත් ඒ නිසා එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරිමට අවස්ථාව සලසා දෙන බවත් සදහන් කරන ලදි.

**<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>**

අපේ හිටපු ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රී වේරපිටිය මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව තමාද ශෝකය ප්‍රකාශ කරන බවත් ගරු වේරපිටිය මැතිතුමා 1997 ගරු නිශ්ශංක හේරත් මැතිතුමා සභාපති ධුරය දැරූ සභාවේ ගරු මන්ත්‍රීවරයකු ලෙස අප සමඟ පත්වූ බවත් එතුමා මන්ත්‍රීවරයෙකු ලෙස ලෙංගතුව කටයුතු කල බවත් ගරු මන්ත්‍රීවරයකු ගෙනා යෝජනාවක් සඳහා ඍජුවම කවදාවත් විරුද්ධ නොවූ බවත් එතුමා එතුමාගේ ප්‍රදේශයේ විශාල සංවර්ධන කාර්යභාරයක් කල බවත් විශේෂයෙන් සභාවේ කටයුතු සඳහා ද කැපවීමෙන් කටයුතු කල බවත් බෝවල සුසාන භූමියේ කටයුතු වලදි දෙතුන් පාරක්ම ඒ පිළිබඳව කථා කර කටයුතු කල බවත් එතුමා තමන් නියෝජනය කල කොටසට පමණක් නොව අනෙක් මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලදිද නිරතුරුවම සහයෝගය දුන් බවත් සියළු දෙනා සමඟම ලෙංගතුව කටයුතු කල බවත් ගියවර මැතිවරණයේදි එතුමා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් ඉදිරිපත් වූ බවත් කිසිදින අපි කණ්ඩායම් කිහිපයකින් දේශපාලනයට ආවා යැයි අපිට නොදැණුනු බවත් සභාවේ කටයුතු වලදි විවිධ හැල හැප්පීම් උනත් සහෝදරයෙක් ලෙස අපි කටයුතු කල බවත් එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා වේරපිටිය මන්ත්‍රීතුමාගේ අවමංගල්‍ය අවස්ථාවේ බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කල  බව ආරංචි වූ බවත් ඒ පිළිබඳව සතුටු වන බවත් එතුමාට ස්තූතිවන්ත වන බවත් සදහන් කරමින්  ගරු වේරපිටිය මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයකුට එහා ගිය සහෝදරත්වයෙන් අප සමඟ කටයුතු කල බවත් එතුමා තම කාර්ය මැනවින් ඉටුකල බවත් අපේ දීර්ඝකාලීන මිත්‍රයාගේ අභාවය දැඩිසේ ශෝකයට කාරණයක් බවත් සදහන් කරමින් මෙම ශෝක යෝජනාව පවුලේ අයට යවන ලෙස ඉල්ලමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථාන කරන ලදි.

**<u>ගරු ජයන්ත කීර්තිසිංහ මන්ත්‍රීතුමා</u>**

අපේ සහෝදර ගරු වේරපිටිය මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව තමාද ශෝක වන බවත් එතුමා 1997 උඩපළාත ප්‍රාදේශිය සභාවට තරඟ කර මන්ත්‍රී ධුරයක් ලැබූ බවත් එතුමා උඩපළාත ප්‍රාදේශිය සභාවේ වාර තුනකදි මන්ත්‍රීවරයකු ලෙස සහභාගි වෙමින් වීශේෂයෙන් බෝවල ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කල බවත් කලින් මනාප ක්‍රමයේදි මෙන්ම කොට්ඨාශ ක්‍රමයේදිද  එතුමා විශාල මනාප ප්‍රමාණයක් රැගෙන මහජන ප්‍රසාදය දිනාගත්  මන්ත්‍රීවරයකු බවත් සභාවේ මංමාවත් ඉදිකිරිමේදි එතුමා මාර්ග නඩත්තුව සඳහා ප්‍රිමෙක්ස් වැඩපලක් ආරම්භ කර කටයුතු කරන ලෙස ඉල්ලූ බවත් කාලයත් සමඟ එය මඟහැරී ගිය බවත් එතුමාගේ නාමය වෙනුවෙන් එම කටයුත්ත කරන ලෙස ඉල්ලීමක් කරන බවත් එතුමා සහෝදරයෙක් ලෙස අප සමඟ කටයුතු කල බවත් පරිසර කමිටුවේ සභාපති ලෙසද කටයුතු කල බව සදහන් කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථාන කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා</u>**

වේරපිටිය යන චරිතය ප්‍රාදේශිය සභාව තුලත් උඩපළාත ප්‍රදේශය තුලත් ඉතාම වටිනා කියන සම්බන්ධකම් තබාගෙන සුහදත්වයෙන් කටයුතු කල චරිතයක් බවත් එතුමාගේ වියෝව විශේෂයෙන්ම දැනෙන කරුණක් බවත් එතුමා මන්ත්‍රී මණ්ඩලය තුල විශේෂ චරිතයක් බවත් එතුමා සභාවට විශේෂ කරුණු දෙකක් ගෙන ආ බවත් වැඩ ඒකකයක් ආරම්භ කිරිම සහ බැකෝ යන්ත්‍රයක් ලබාගැනීම සඳහා එතුමා වාද විවාද කල බවත් එම යෝජනා මගින් ප්‍රාදේශිය සභාවේ අත්‍යවශ්‍ය කටයුතු කරගැනිමට එතුමා බලාපොරොත්තු වු බවත් එතුමා රෝගාතුරව සිටියේදි පවා ගමේ කටයුතු කල බවත් අද වන විට අපේ සහෝදරයා අප අතරින් වෙන්වි ඇති බවත් සඳහන් කරමින් නිවන් සුව ප්‍රාර්ථනා කරන ලද අතර උප සභාපතිතුමා ඇතුළු අප පක්ෂයේ සියළු දෙනාගේද ශෝකය ප්‍රකාශ කරන ලෙස සඳහන් කල බවත් ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා අපත් සමඟ සිටි කාලයේ බොහෝ සුහදත්වයෙන් කටයුතු කල නිසා එතුමාගේ අභාවය සැල වූ විට තමා කම්පනයට පත් වු බවත් එතුමාගේ අභාවය බෝවල ප්‍රදේශයට පමණක් නොව උඩපළාත බල ප්‍රදේශයටද අපේ පක්ෂයටද පාඩුවක් බවත් එතුමා මෙම සභාව තුළ විශාල වැඩ කොටසක් කල බවත් ගරු කීර්ති මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි එතුමාගේ සිහිනයන් දෙක ඉදිරි කාලයේදි සැබෑ වේ යැයි අප සිතන බවත් තම කොට්ඨාශය වෙනුවෙන් එතුමා සෑම දිනකම හඩ නැඟු බවත් තම ප්‍රදේශයට ණය නොමැතිව සාධාරණයක් කල බවත් එතුමා කා සමඟත් ගැටුම් ඇති කර ගැනිමෙන් තොරව සුහදව කටයුතු කල බවත් සභාවේ සේවකයන් වැඩිපුරම උපකාර කලේ ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට බවත් ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩිපුරම කටයුතු කලේ එතුමා බවත් නමුත් මේ වන විට එතුමා අපෙන් සමුගෙන අවසන් බවත් එතුමා බලාපොරොත්තු වු කාර්යභාරය ඉදිරියේදි ඉටු කරමු යැයිද සඳහන් කරමින් එතුමා වෙනුවෙන් ශෝක පණිවුඩය පවුලේ අය වෙත යවන ලෙස ඉල්ලමින් ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

**<u>ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා</u>**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා යනු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බිහි වු මුල් කාල පරිච්ඡේදයේ තමා හඳුනාගත් නිහතමානි ගුණගරුක යහපත් අයෙකු බවත් එතුමා සමඟ දේශපාලනය කරන විට එතුමා අපට ගුරුහරුකම් ලබාදුන් බවත් එතුමාගේ වියෝව මෙතරම් ඉක්මනින් වේ යැයි තමා නොසිතු බවත් සඳහන් කරමින් තමාගේද තම ප්‍රදේශයේ ජනතාවගේද තම පවුලේ අයගේද ශෝකය ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා</u>**

අපේ හිටපු ගරු සභාපති නිශ්ශංක හේරත් මැතිතුමාගේ සහ ගරු වේරපිටිය මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන් කළුගමුව ජනතාවගේ ශෝකය ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය</u>**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා අප වෙනුවෙන් නිතර කථා කල අයෙකු බවත් සෑම දිනකම එතුමා ප්‍රිමෙක්ස් වැඩපළක් ආරම්භ කිරීම පිළිබඳව සභාවේ මතක් කල බවත් එම කටයුත්ත ඉටුකල යුතු බවත් එතුමාගේ යහපත් ගුණාංග පිළිබඳව අනෙක් ගරු මන්ත්‍රීවරු සඳහන් කල බවත් සඳහන් කරමින් ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

**ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා සහ තමා නිතර ඉතා ළඟින් ඇසුරු කල බවත් එතුමාගේ වියෝව තමාට තවමත් දැඩිව දැනෙන බවත් එය තම ජීවිතයේ සංවේදි අවස්ථාවක් බවත් එතුමා නායකත්ව හැකියාවන් පිරි අයෙකු බවත් සඳහන් කරමින් ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

**ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා කුමන දේශපාලන මත දැරුවද සුහදශීලිත්වයෙන් කටයුතු කල බවත් දොරගල වත්ත ප්‍රදේශයේ ජනතාවට එතුමා බොහෝ උපකාරි කල බවත් ජනතාවට වැඩ කල යුතුය යන මතය දැරූ බවත් සඳහන් කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන් දමිළ ජනතාවගේ ශෝකය ප්‍රකාශ කරන ලදි.

**ගරු උදයකුමාර දිසානායක මන්ත්‍රීතුමා**

ගරු වේරපිටිය මන්ත්‍රීතුමා අප සමඟ දෙවතාවක් මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කල බවත් එවිට අපට වැඩිහිටියෙකුගෙන් ලැබිය යුතු අවවාද අනුශාසනා ලබාදුන් බවත් අපව නිවැරදි මාර්ග වලට යොමු කල බවත් ගම්පොල ප්‍රදේශය පුරාම එතුමා ගරු දි.මු.ජයරත්න මැතිතුමා සහ ගරු අනුරාධ ජයරත්න මැතිතුමා සමඟ එක්ව විශාල වැඩ කොටසක් කල බවත් සඳහන් කරමින් ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස සභාවේ ධූර කාලය ක්‍රියාත්මක වන අවධියේ අවසන් ගමන් ගිය දෙවන මන්ත්‍රීතුමා ගරු වේරපිටිය මන්ත්‍රීතුමා බවත් ඒ නිසා අපේ කණගාටුව අධික බවත් එතුමා ඉතාමත් හොඳ විනෝදකාමී චරිතයක් බවත් බෝවල,උනම්බුව,හපුගස්පිටිය යන කොට්ඨාශ වලට දැවැන්ත සංවර්ධනයක් කල ඊට මුල පිරූ චරිතයක් බවත් උඩපළාත බල ප්‍රදේශයේද ගම්පොලද උඩුනුවර ආසනයේද විශාල විශේෂ සංවර්ධන ව්‍යාපෘති වලට දායක වූ අයෙකු බවත් ගරු අනුරාධ ජයරත්න මැතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරිවරයෙකු ලෙස උඩපළාත,දොළුව යන කොට්ඨාශ වල ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධීකරණය කලේ මෙතුමා බවත් එම කාර්යය තුළින් අද වන විට විශාල ජනතාවක් ජලය ලබාගන්නා බවත් එතුමාගේ කැපවීම මත එය සිදුවූ බවත් දේශපාලඥයෙකුගෙන් ඔබ්බට ගොස් ජනතා සුභ සිද්ධිය උදෙසා එතුමා කටයුතු කල බවත් එතුමාගේ අභාවය බෝවල ජනතාවට මෙන්ම මුළු උඩපළාතටම පාඩුවක් බවත් එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ සභාවේ සාතිශය සංවේගය පල කරන බවත් මෙම දිනවල පවතින වාතාවරණය මත බොහෝ පිරිසකට එම අවමංගල කටයුතු සඳහා සහභාගී වීමට නොහැකි වූ බවත් සඳහන් කරමින් ගරු වේරපිටිය මන්ත්‍රීතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙම සභාවේ මන්ත්‍රීවරු ගෙනා යෝජනා කිසිවක් තමා පැහැර හැර නොමැති බවත් JCB යන්ත්‍රයක් ගැනීමට එතුමා යෝජනා කල බවත් නමුත් තවම අනුමැතිය නොලැබුණු බවත් අපි කිසිවෙකුගේ වරදක් නොමැති බවත් එමෙන්ම ප්‍රිමෙක්ස් වැඩපළක් ආරම්භ කිරිමටද නොහැකි වූයේ පසුගිය කාලයේ පැවති වාතාවරණය නිසා බවත් නමුත් ඉදිරියේදි අපි හැකි ලෙස එම කටයුතු කරන බවත් සඳහන් කරමින් සභාපති ලෙස උඩපළාත බල ප්‍රදේශයේ ජනතාවගේත් ගරු මන්ත්‍රී මණ්ඩලයේත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේත් ශෝකය ප්‍රකාශ කරන බවත් එම ශෝක යෝජනාව යැවීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

**තීරණ අංක 05.1 (3)**

5 (1.3)මහජන පුස්තකාල වල පාඨකයින්ගේ සහභාගීත්වය වැඩි කරගැනීම,පාඨක රුචිය වැඩිකර පොත්පත් පරිශීලනය වැඩි කිරීම යන අරමුණු මුල්කරගෙන පාඨකයින් සදහා නොමිලේ සාමාජිකත්වය ලබාදීම සුදුසු බවට 2022.03.29 වන දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුවේදී යෝජනා විය.ඒ අනුව පාඨක සංඛයාව වර්ධනය කරගැනීමේ අරමුණින් 2022 ජූනි,ජූලි සහ අගෝස්තු මාස සදහා මහජන පුස්තකාල පාඨකයන් වෙනුවෙන් නොමිලේ සාමාජිකත්වය ලබාදීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක් බව සදහන් කරමින් පාඨක සංඛයාව වර්ධනය කරගැනීමේ අරමුණින් 2022 ජූනි,ජූලි සහ අගෝස්තු මාස සදහා මහජන පුස්තකාල පාඨකයන් වෙනුවෙන් නොමිලේ සාමාජිකත්වය ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනා ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

**තීරණ අංක 05.1 (4)**

5(1.4)ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පාලිත ජිනදාස මයාගේ මුල්ගම ඉඩමේ කොටසක ඉදිකර ඇති ජල ටැංකිය හා එහි පිවිසුම් මාර්ගයට අයත් ඉඩම් කොටස සභාව වෙත පවරා ගැනිමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

එම ඉඩම් කොටස සභා අරමුදලින් මැණුම් කටයුතු කර එම ඉඩම අත්පත් කරගැනීම සුදුසු බව සදහන් කරමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පාලිත ජිනදාස මයාගේ මුල්ගම ඉඩමේ කොටසක ඉදිකර ඇති ජල ටැංකිය හා එහි පිවිසුම් මාර්ගයට අයත් ඉඩම් කොටස සභාව වෙත පවරා ගැනිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (5)</u>**

5(1.5)පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන වත්තේහේන ජල යෝජනා ක්‍රමය සඳහා දෛනික පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනිම (පළාත් පාලන කොමසාරිස්ගේ සිපිසි/සිඑල්ජී/1/5/1-20 දරණ 2019/02/07 දිනැති ලිපිය අනුව) සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමසුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (6)</u>**

5(1.6)සිව් අවුරුදු සැළැස්ම සකස් කිරීමට අදාළ උපදේශක කාරක සභාව පිහිටුවීමසඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමසුදුසු බවට මම යෝජනා කරමි.

සිව් අවුරුදු සැළැස්ම සකස් කිරීමට අදාළ උපදේශක කාරක සභාව සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ අට දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බවද මම යෝජනා කරමි.

**<u>ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා</u>**

සිව් අවුරුදු සැළැස්ම සකස් කිරීමට අදාළ උපදේශක කාරක සභාව පිහිටුවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

එම කමිටුව සඳහා ගරු අගලවත්ත මන්ත්‍රීතුමා,ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා,ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා,ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා,ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා,ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා,ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය,ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය යන අය සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (7)</u>**

5(1.7)පාරදෙක ප්‍රදේශයෙහි හෝම් ලෑන්ඩ් සමාගම මඟින් විකිණීම සඳහා සකස් කොට ඇති මිස්ට් හයිඩ් අවුට් නම් ඉඩමෙහි උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් වන මාර්ගයට ආසන්න වර්ග මීටර හතරක බිම් කොටසක් විදුලි පහන් කණුවක් සිටුවා ඒ මත දුරකථන තරංග ඇන්ටෙනාවක් සවිකිරීම සඳහා ලබාදෙන ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම විසින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කරමින් එම ඉඩම් කොටස ලබාදීම සුදුසු බවද ඒ වෙනුවෙන් මාසිකව රු.7500.00ක මුදලක් එම අදාළ සමාගමෙන් අයකරගැනීම සුදුසු බවද මම යෝජනා කරමි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

මේ මගින් අපට ඉඩම් කොටසට හා කුළුණට ලෙස අවස්ථා දෙකකට මුදල් අයකරගත හැකි නිසා එම ඉඩම් කොටසට වෙනම මුදලක්ද කුළුණට වෙනම මුදලක්ද අයකර ගැනීම සුදුසු බව සඳහන් කරන ලදි.

**<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>**

එම ඉඩම් කොටස ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගමට ලබාදී ඒ වෙනුවෙන් මාසිකව රු.7500.00ක මුදලක් එම අදාළ සමාගමෙන් අයකරගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා</u>**

මෙම ආයතනවලින් අයකර ගැනීමට අදාළ ලෙස අයකරන ගාස්තු තිබෙන බවත් ඒ පිළිබඳව සොයා බලා නිගමනයකට ඒම සුදුසු බවත් මම යෝජනා කරමි.

එසේම වාර්ෂිකව සිදුකරන සංශෝධන සහිතව එම රු.7500.00ක මුදල අයකර ගැනීම සුදුසු බවද මම යෝජනා කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (8)</u>**

5(1.8)වත්තේහේන ජල ව්‍යාපෘතියේ මේ වන විට මීටර් ගාස්තු අයකර ගැනීමකින් තොරව 138 කට පමණ ජලය ලබාදෙන බවත් මිනිසුන්ගෙන් දැන් එම මුදල් අයකරගත නොහැකි නිසා එම අයගෙන් ජලය ලබාදුන් දවසේ සිට ස්ථාවර ගාස්තු ලෙස මාසයකට රු.150.00 බැගින් අයකර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

එසේම පොදුවේ සියළු ජල පාරිභෝගිකයින්ගෙන්ම එක් අයෙකුගෙන් රු.2000.00 බැගින් අයකර ගැනීමද සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>**

ඉදිරි මාසයේදී මීටර් දැමිය නොහැකි වුනොත් ස්ථාවර ගාස්තු අමතර ගාස්තු ලෙස රු.200.00ක මුදලක් අයකර ගැනීමට කටයුතු කල යුතු බව සඳහන් කරමින් එම අයගෙන් ජලය ලබාදුන් දවසේ සිට ස්ථාවර ගාස්තු ලෙස මාසයකට රු.150.00 බැගින් අයකර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව හා පොදුවේ සියළු ජල පාරිභෝගිකයින්ගෙන්ම එක් අයෙකුගෙන් රු.2000.00 බැගින් අයකර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>තීරණ අංක 05.1 (9)</u>**

5(1.9)උඩපළාත ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය ආහාරපාන සැපයීම සඳහා ලියාපදිංචි වී ඇති සීතා රෙස්ටුරන්ට් ආයතනයේ අනුමත මිලට වඩා කෑම පැකට් එකක් රු.110.00කින් මිල වැඩි වී ඇති බවත් ඉදිරි මාස වන විට තව එම මුදල වැඩිවිය හැකි බවත් දන්වන ලදි.එවිට අයවැයෙන් ආහාර සඳහා වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා ෆ්‍රයිඩ් රයිස් වෙනුවට සාමාන්‍ය කෑම පැකට් එකක් ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>**

දහවල් කෑම පැකට් ලබා නොදි උදෑසන තේ පැන් සංග්‍රහාය පමණක් හොදට ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

විශේෂ අවස්ථාවක කෑම ලබාදීමට අවශ්‍ය වූවොත් පමණක් ලබාදී සාමාන්‍ය කෑම පැකට් එකක් ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව සලකා බලන බවත් උදෑසන තේ පැන් සංග්‍රහාය හොඳින් ලබාදෙන බවත්සඳහන් කරන ලදි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

**තීරණ අංක 05.1 (10)**

5(1.10)විමලරත්න වැල්ඩින් වැඩපලෙන් රු.439,300.00 මුදලකට අවම මිල යටතේ 252-6339 කැබ් රථය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීමට යාන්ත්‍රික ඉංජිනේරුතුමිය අනුමැතිය ලබාදුන් අතර නමුත් කැබ් රථයට අළුතින්ම සීට් සෙට් එකක් සවි කිරීමට සහ වින්ඩ්ස්ක්‍රීන් එක අළුතින්ම සැපයීමට තවත් රු.122,500.00ක මුදලක් වැය වන බව අදාළ ආයතනය දන්වා ඇත.එම නිසා රු.561,800.00ක මුදලක් වැය කර අදාළ සමාගමෙන් 252-6339 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

**තීරණ අංක 05.1 (11)**

5(1.11)විශ්‍රාමික රාජ්‍ය නිලධාරින් නැවත සේවයේ යොදවා ගැනිමේ කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණ නිලධාරි යූ.අයි.වීරසූරිය මිය සභා අරමුදලින් ගෙවීම් කටයුතු කර නැවත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික රාජ්‍ය නිලධාරින් නැවත සේවයේ යොදවා ගැනීම මේ වන විට නතර කර ඇති නමුත් රාජකාරි කටයුතු සඳහා තාක්ෂණ නිලධාරින්ගේ සේවය අත්‍යාවශ්‍ය වන අතර තාක්ෂණ නිලධාරි පි.ජී.එස්.ජයතිලක මහතාව 2023 ජනවාරි මස 12 වන දින වන තෙක් සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලැබී ඇති බවත් ඉන්පසු නැවත මහ සභා තීරණයක් ගත යුතු බවත් තාක්ෂණ නිලධාරි යූ.අයි.වීරසූරිය මිය සඳහා සභා අරමුදලින් ගෙවීම් කටයුතු කර නැවත සේවයේ යොදවා ගැනීමට මහ සභා තීරණයක් ගත යුතු බවත් සඳහන් කරන ලදි.

**ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා**

විශ්‍රාමික රාජ්‍ය නිලධාරින් නැවත සේවයේ යොදවා ගැනිමේ කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණ නිලධාරි යූ.අයි.වීරසූරිය මිය සභා අරමුදලින් ගෙවීම් කටයුතු කර නැවත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.

**කර්මාන්ත අනුමැතිය**

**කර්මාන්ත යෝජනා**

**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**

5 (2.1)අටබාගේ නුවරඑළිය මාර්ගයේ සිටවත්තහේන දක්වා දිවෙන B.C මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.2)දොළුව මස්ගොල්ල ග්‍රාමසේවා වසමේ හදපුබුදුගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා රු. සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.3)මිල්ලගහමුල පුපුරැස්ස ප්‍රධාන මාර්ගය ආරම්භ වන මුතුහවඩි ගෙදර මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා රු.500,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු වයලා විනෝදනී මන්ත්‍රීතුමියගේ යෝජනා**

5 (2.4)උඩගම මහ විද්‍යාලය අසලින් මහරවෙල දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.5)උඩගම ගාමිණි මහතාගේ නිවස අසළ මොලියා පිහිල්ල සංවර්ධනය කිරීම සඳහා රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.6)උඩගම ලක්ෂ්මන් මහතාගේ නිවස අසළ කටුකිතුල්දෙණිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**සංශෝධන යෝජනා**

**ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.7)මැදගම්මැද්ද සමන්ත මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.100000.00කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

ඉහළගම ලීමගස්කොටුව හරහා කන්දගමට යන මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ධර්මසිරි අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.8)වනහපුව ජනපද ප්‍රේමාවතී මියගේ නිවස අසල සිට නෙල්ලි ගහ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම රු.200,000.00 කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

ඉහළගම කැටවල මාර්ගයේ සිට වත්ත කඩේ දක්වා ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරීමසුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කුමාරවේළු කනගරත්නම් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.9)නයාපාන උඩකොටස ප්‍රජාශාලාවසංවර්ධනය කිරීම රු.150,000.00කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

නයාපාන උඩකොට්ඨාශය සඳහා ක්‍රීඩාපිටියක් සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ආර්.එම්.පී බණ්ඩාර මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.10)පාර පහ හන්දියේ සිට නො-04 ජනපදය දෙසට ඇති අබලන් වී ඇති මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු.550000.00කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

පුපුරැස්ස බස් නැවතුම්පොලේ අළුත්වැඩියා කටයුතු සඳහා ඉවත් කරන ලද වැසිකිළි පද්ධතිය වෙනුවට නව වැසිකිළි පද්ධතියක් සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.11)කන්දේ මාර්ගයේ සිට ඉර්සාත් මහතාගේ නිවස අසලින් යන කාණුව ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන කොටසසංවර්ධනය කිරීම රු.100,000.00කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

කළුගමුව ජුම්මා පල්ලිය අසළ සිට ෆාරුක් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.12)ගනේගොඩ ග්‍රාමසේවා කාර්යාලය අසළින් පහළට යන මාර්ගය සංවර්ධනය කිරීම රු.250,000.00 කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස,

පෞද්ගලික බෙහෙත් ශාලාව අසලින් ජයරත්න මහතාගේ නිවස අසළින් ඉහළට සහ ගම මැදට යන මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.13) උනම්බුව හුණුගලවත්ත ඒ.එල්.එම්.හාසන් මයාගේ නිවස අසළ මාර්ගයේ බෝක්කුව සකස් කිරීම රු.200,000.00 කර්මාන්තය ,

උනම්බුව ගෙවල් 20 ඒකනායක මහතාගේ නිවස අසළ මාර්ගයේ බෝක්කුව සකස් කිරීම රු.100,000.00 කර්මාන්තය,

ඉලංගවත්ත ප්‍රජාශාලාවේ පළවෙනි මහළ ඉදිකිරීම රු.150,000.00 කර්මාන්තය,

ඉලංගවත්ත රිස්නි මයාගේ නිවස ඉදිරිපිට මාර්ගය සහ බෝක්කුව ඉදිකිරීම රු.100,000.00 කර්මාන්තය යන කර්මාන්ත වෙනුවට සංශෝධන කර්මාන්ත ලෙස

I. සභාවට අයත් ඉලංගවත්ත ප්‍රජා ශාලාවේ පළවෙනි මහළ ඉදිකිරීම රු.450,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.
II. ඉලංගවත්ත රිස්නි මයාගේ නිවස ඉදිරිපිට මාර්ගය සහ කාණුව සංවර්ධනය කිරීම .100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා**

ඉදිරිපත් කර ඇති කර්මාන්ත යෝජනා සහ සංශෝධන යෝජනා සියල්ල ඉවුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා සියල්ල මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**<u>(6) කාරක සභා වාර්ථා ඉදිරිපත් කිරීම</u>**

1. 2022.04.08 වන දින කර්මාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම
2. 2022.04.29 වන දින නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම
3. 2022.05.17 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

ඉදිරිපත් කර ඇති කමිටු වාර්ථා සියල්ල පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

**<u>ගරු කිර්ති රත්නායක මන්ත්‍රීතුමා</u>**

ඉදිරිපත් කර ඇති කමිටු වාර්ථා සියල්ල පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>.**

**(7) ආදායම් වියදම් වාර්ථා ඉදිරිපත් කිරීම**

2022 මාර්තු මස හා 2022 අප්‍රේල් මස ආදයම් වියදම් වාර්තා සහ 2022.03.31 දිනට ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාවඉදිරිපත් කිරීම

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2022 මාර්තු**

| | | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|---|
| **10** | | <u>වරිපනම් හා බදු</u> | | | 1 | වැටුප් හා දීමනා | 5,565,642.61 |
| | i | වරිපනම් හා බදු | 141,776.86 | | | | |
| | ii | අක්කර බදු | 1,515.00 | | 2 | ගමන් වියදම් | 263,968.00 |
| | iii | ජල ගාස්තු | 4,175.00 | | | | |
| | iV | ව්‍යාපාර බදු | 182,400.00 | 329,866.86 | 3 | සැපයුම් හා උපකරණ | 543,670.00 |
| **20** | | <u>කුළී</u> | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | i | ගෙවල් කුළී | 1,975.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | 26,450.00 |
| | ii | වෙළඳ අයිතිය බදු දීම | 330,676.00 | | | අළුත්වැඩියාව හා | |
| | iii | පොදු වැසිකිළිය | - | | | නඩත්තුව | |
| | iv | බදු මුදල් | - | | | | |
| | v | කුලියට දීම | | 332,651.00 | | | |
| **30** | | බලපත්‍ර ගාස්තු | | | | | |
| | i | වෙළඳ බලපත්‍ර | 242,450.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා | 237,840.06 |
| | ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 31,200.00 | 273,650.00 | | අවශ්‍යක සේවා | |
| **40** | | සේවා සඳහා ගාස්තු | | | | | |
| | i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 103,428.55 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 8,310.24 |
| | ii | අය කර ගත හැකි ගාස්තු | 520,564.11 | 623,992.66 | | | |
| **50** | | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් | 58,950.00 |
| | | | | | | සහනාධාර | |
| | i | දඩ මුදල් | 5,250.00 | 6,087.60 | | | |
| | 2 | වරෙන්තු ගාස්තු | 837.60 | | | | |
| **60** | | වෙනත් ආදායම් | | | | | |
| | i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම | - |
| | ii | විකුණුම් | 311,269.00 | | | ප්‍රතිලාභ පාරිතෝෂික | |
| | iii | මුද්දර ගාස්තු | 3,652,353.00 | | | | |
| | iV | සේවක ණය පොලී | 52,399.72 | 4,016,021.72 | | | |
| **70** | | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | - |
| | i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 4,906,637.15 | | | | |
| | ii | සාමූහික ආධාර | - | 4,906,637.15 | | ආදායමින් ආපසු ගෙවීම් | 6,000.00 |
| **80** | | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | 69,000.00 |
| | i | මූලධන ආධාර | - | - | | සේවක ණය | 421,800.00 |
| සේවක ණය | | | | 314,104.00 | | ණයහිමි ගෙවීම් | 5,363,163.30 |
| තැන්පත් | | | | 533,833.68 | | තැන්පත් | 243,172.38 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | | | | | | අතිරික්තය | |
| අත්තිකාරම් පියවීම | | | | 35,000.00 | | | |

| | | |
|---|---|---|
| අගරු චෙක් | 100.00 | |
| ඌනතාවය | 1,436,021.92 | |
| | **12,807,966.59** | **12,807,966.59** |

## උඩපළාත ප්‍රාදේශීය සභාව
## ආදායම් වියදම් වාර්තාව - 2022 අප්‍රේල්

| | | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|---|
| **10** | | වරිපනම් හා බදු | | | 1 | වැටුප් හා දීමනා | 5,288,050.03 |
| | i | වරිපනම් හා බදු | 52,636.54 | | | | |
| | ii | අක්කර බදු | - | | 2 | ගමන් වියදම් | 106,995.70 |
| | iii | ජල ගාස්තු | 31,199.75 | | | | |
| | iV | ව්‍යාපාර බදු | 70,750.00 | 154,586.29 | 3 | සැපයුම් හා උපකරණ | 444,183.00 |
| **20** | | කුළී | | | | | |
| | i | ගෙවල් කුළී | 1,225.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | 14,800.00 |
| | ii | වෙළඳ අයිතිය බදු දීම | 309,429.00 | | | අළුත්වැඩියාව හා නඩත්තුව | |
| | iii | පොදු වැසිකිළිය | - | | | | |
| | iv | බදු මුදල් | - | | | | |
| | v | කුලියට දීම | | 310,654.00 | | | |
| **30** | | බලපත්‍ර ගාස්තු | | | | | |
| | i | වෙළඳ බලපත්‍ර | 121,750.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 183,791.98 |
| | ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 9,600.00 | 131,350.00 | | | |
| **40** | | සේවා සඳහා ගාස්තු | | | | | |
| | i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 18,343.00 | | 6 | පොලී ගෙවීම් | 11,440.85 |
| | | | | | | ලාභාංශ හා ප්‍රසාද මුදල් | |
| | ii | අය කර ගත හැකි ගාස්තු | 163,175.00 | 181,518.00 | | | |
| **50** | | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 56,125.00 |
| | i | දඩ මුදල් | 4,777.00 | 5,544.70 | | | |
| | 2 | වරෙන්තු ගාස්තු | 767.70 | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 251,613.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | - | | | | |
| iV | සේවක ණය පොලී | 46,743.74 | 298,356.74 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | 491,188.29 |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 4,736,404.59 | | | | |
| ii | සාමූහික ආධාර | - | 4,736,404.59 | | ආදායමින් ආපසු ගෙවීම් | - |
| **80** | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | 30,000.00 |
| i | මූලධන ආධාර | - | - | | සේවක ණය | 608,700.00 |
| සේවක ණය | | | 305,549.36 | | ණයහිමි ගෙවීම් | 6,620,680.60 |
| තැන්පත් | | | 251,059.87 | | තැන්පත් | 258,601.55 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | | | | | අතිරික්තය | |
| අත්තිකාරම් පියවීම | | | 50,105.00 | | | |
| ඌනතාවය | | | 7,689,428.45 | | | |
| | | | **14,114,557.00** | | | **14,114,557.00** |

**ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා**

2022 මාර්තු මස හා 2022 අප්‍රේල් මස ආදයම් වියදම් වාර්තා සහ 2022.03.31 දිනට ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා**

පසුගිය මාර්තු සහ අප්‍රේල් මාස වල ආදායම් වියදම් වාර්තා අප වෙත ලැබී ඇති බවත් මාර්තු මස ආදායම් වියදම් වාර්තාව බැලූ කල ආදායම් ලෙස වරිපනම් හා බදු යන කාරණාවේදී එකතුව ලෙස රු.329,866.86 ලෙසද කුළී යටතේ ගෙවල් කුළී වෙළඳ අයිතිය බදුදීම රු.332,651.00 ලැබී ඇති බවත් නමුත් එම මස කුළී යටතේ පොදු වැසිකිළිය හා බදු මුදල් යන කාරණාවල් ලැබී නොමැති බවත් වෙළඳ බලපත්‍ර ගාස්තු ලෙස රු.242,450.00 ද වෙළඳ බලපත්‍ර ත්‍රීරෝද රථ යටතේ රු.31,200.00 ලෙසද රු.273,650.00ක එකතුවක් බලපත්‍ර ගාස්තු ලෙස ලැබී ඇති බවත් වෙනත් ආදායම් යටතේ මුද්දර ගාස්තු රු.3,652,353.00 ලැබී ඇති බවත් සේවක ණය පොලිය රු.52,399.72 ලැබී ඇති බවත් ඉදිරි මාස වන විට මේ සියල්ප බිංදුවටම අඩු විය හැකි බවත් පසුගිය කාල වලදි කෝටියකට ආසන්න මුදලක් මුද්දර ගාස්තු ලැබුණු බවත් පරිපාලන

ප්‍රතිපූර්ණය ලෙස රු.4,906,637.15 ලැබී ඇති බවත් සේවක ණය රු.314,104.00 ද කර්මාන්ත ණයගැති ලැබීම් තැන්පත් රු.533,833.68 ද අත්තිකාරම් පියවීම රු.35,000.00 ද ඒ අනුව වියදමට සාපේක්ෂව ආදායම ගැලපීමේදි ඌනතාවය ලෙස රු.1,436,021.92 හිඟයක් සහිතව ගලපා ඇති බවත් රු.12,807,966.59 එම මස වියදම වී ඇති බවත් වියදමේදි වැටුප් සහ දීමනා කාරණාවට රු.5,565,642.61 ද ගමන් වියදම් රු.263,968.00 ද ආදි ලෙස ගලපා ඇති බවත්,

අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව බැලූ කල මාර්තු මාසයට වඩා අඩුවක් පෙන්නුම් කරන බවත් වරිපනම් හා බදු යටතේ රු.52,636.34 වැනි අඩු මුදලක් පෙන්නුම් කරන අතර එය මාර්තු මස හා සැසදීමේදි හරි අඩකටත් අඩු අගයක් බවත් ජල ගාස්තු රු.31,199.75ද ව්‍යාපාර බදු රු.70,750.00 ද වරිපනම් හා බදු කාණ්ඩ යටතේ 154,586.29 ලැබී ඇති බවත් වෙළඳ අයිතිය බදුදීම රු.309,429.00 ද වෙළඳ බලපත්‍ර ගාස්තු රු.121,750.00ද පරිපාලන ප්‍රතිපූර්ණය රු.4,736,404.59 ද සේවක ණය ආපසු ලැබීම් 3,505.36 ද පෙන්වා දී ඇති අතර එම මස ඌනතාවය ලෙස රු.7,689,428.85 පෙන්වන බවත් සමස්ථ වියදම ලෙස රු.14,114,557.00 පෙන්වන බවත් වැටුප් හා වේතන රු.5,288,000.00 ද ණයහිමි ගෙවීම් රු.6,620,680.60 ද පෙන්නුම් කරන බව සඳහන් කරමින් 2022 මාර්තු මස හා 2022 අප්‍රේල් මස ආදයම් වියදම් වාර්තා සහ 2022.03.31 දිනට ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

<u>ගරු කීර්ති රත්නායක මන්ත්‍රීතුමා</u>

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා</u>

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.

**(8)** වෙනත් **-**

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

ඉදිරි මහ සභා දිනය පවත්නා තත්වය මත තීරණය කරන බව සඳහන් කරන ලදි.

**(10) මහ සභාව අවසන් කිරීම**

**<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>**

අද දින බොහෝ රාජකාරි අතරතුර උඩපළාත බල ප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය තකා මහ සභා වාරය සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වන අතර සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් ප.ව.13.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

| | |
|---|---|
| ලේකම් | සභාපති |
| උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව |